## සංක්ෂිප්තය


රජයේ 1 AB සහ 1C පාසල්වල අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතිය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණය මගින් අපේක්ෂා කෙරේ.

තෝරාගත් නියැදියට අයත් පාසල්වල අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතියට අදාළ අංග කොපමණ මට්ටමකින් තිබේ ද යන්න සොයා බලන අතර, ඒ ඒ පාසල්වල අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතිය ක්‍රියාත්මක වීමේ දී දැකිය හැකි ප්‍රබලතා හා දුබලතා හඳුනා ගනිමින් ඊට බලපා ඇති හේතු සොයා බැලීම ද කරනු ලබයි. පාසල් අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතිය ක්‍රියාත්මක වීම සම්බන්ධව විදුහල්පතිවරුන් දක්වන අදහස් විමසා බැලීම හා එමගින් සාර්ථක කළමනාකරණ තොරතුරු පද්ධතියක් ක්‍රියාත්මක වීමට අවශ්‍ය ප්‍රවේශ හඳුනා ගැනීම ද කර ඇත.

පර්යේෂණය සඳහා රත්නපුර දිස්ත්‍රික්කයේ ඇඹිලිපිටිය කලාපයේ පාසල් 10 ක් තෝරා ගන්නා ලදී. එම පාසල්වල විදුහල්පතිවරුන් හා මූල්‍ය සහකරුවන් සහේතුක ක්‍රමය මත තෝරා ගන්නා ලද අතර, ගුරුවරු අහඹු නියැදුම් ක්‍රමය අනුව තොරා ගන්නා ලදී. දත්ත රැස් කිරීමේ දී ප්‍රධාන වශයෙන් නිරීක්ෂණය යොදා ගත් අතර ඊට අමතරව විදුහල්පතිවරුන් සමග කළ සම්මුඛ සාකච්ඡා මගින් නිරීක්ෂණ දත්තවල නිරවද්‍යතාවය සොයා බලන ලදී. එසේම මූල්‍ය සහකරුවන් හා ගුරුවරුන් සමග කළ සාකච්ඡා මගින් ද අවශ්‍ය තොරතුරු ලබා ගැනීම සිදු විය.

ඉහත කී ක්‍රම මගින් ලබාගත් දත්ත විශ්ලේෂණය කිරීම අරමුණු ඔස්සේ සිදු කර ඇත. ඒ අනුව පළමු අරමුණ විස්තරාත්මක ක්‍රමයටත්, දෙවන, සිව්වන සහ පස්වන අරමුණු වගු ප්‍රතිශත ආකාරයටත්, තෙවන අරමුණ සංඛ්‍යාන විද්‍යාත්මක ක්‍රම මගිනුත් විශ්ලේෂණය කර ඇත. පර්යේෂණයට අදාළ නිගමන පර්යේෂණ අරමුණු අනුව දක්වා ඇත.

සමස්ත පර්යේෂණ ක්‍රියාවලිය තුළින් පෙනී ගිය වැදගත් කරුණු කිහිපයකි. නියැදියට අදාළ පාසල්වල අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතිය පිළිබඳ එතරම් අවබෝධයක් මෙන්ම හැඟීමක් ද නොමැති බව, අදාළ පන්ති සම්බන්ධ තොරතුරු අක්‍රීයව පවතින අතර ඒවා ඵලදායී කාර්යයන් සඳහා යොදා ගන්නා බවක් හෝ ඒවා යාවත්කාලීන කිරීමක් සිදු නොවීම, තොරතුරු පද්ධතිය ක්‍රමවත් නොවීම නිසා පාසල් කටයුතුවලින් වැඩිපුර කාලයක් වැයවීම ද දක්නට ලැබීම, බොහෝමයක් පාසල්වල ඇති සුළු ඉඩකඩ තුළ තොරතුරු ලිපිගොනු ගොඩ ගැසී ඇති අතර ඒවා පත් ගන්නා සුළු ආකාරයෙන් ගොනු කර තැබීමක් ද දක්නට නොමැති වීම හා එදිනෙදා අවශ්‍ය තොරතුරු ගොනුකර තැබීම විනා ඒ පිළිබඳ ඇති දැනුවත්භාවයේ ඌනතාවයක් ද දක්නට ලැබෙන බව මේ අනුව පෙනී යන්නේ පාසල්වල අධ්‍යාපන කළමනාකරන තොරතුරු පද්ධතිය තවදුරටත් සංවර්ධනය විය යුතු බවයි.

පාසල් බොහොමයක අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතියට අදාළ පද්ධති යටතේ වන බොහොමයක් කරුණු ..ට ලැබුණ ද එහි විවිධ අඩුපාඩු පවතී. ඇතැම් උප පද්.. යටතේ වන තොරතුරු පාසල්වලට අ..ළ නොවීම නිසා ඒ පිළිබඳ ප්‍රතිචාර ද ලැබී නොතිබුණි. ඇතැම් තොරතුරු පවත්වාගෙන ගිය ද ..වා නිසිලෙස සම්පූර්ණ ක්‍රමවත්ව පවත්වාගෙන යන බවක් නොපෙනේ.

බොහොමයක් පාසල්වල තොරතුරු සම්බන්ධ කටයුතු අතින් සිදුකිරීම නිසා ඒ පිළිබඳව කටයුතු කිරීමට මැලිකමක් දක්වති. සමහර තොරතුරු ලිඛිතව පවත්වාගෙන ගිය ද එම තොරතුරු තවත් පාර්ශවයකට ඉදිරිපත් කිරීමට මිස තීරණ ගැනීමේ ක්‍රියාවලියට හෝ ඉදිරි සැලසුම් සඳහා යොදා ගන්නා බවක් ද නොපෙනෙයි. පාසල් පද්ධතිය තුළ අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතිය ක්‍රියාත්මක වීම සම්බන්ධ පොදු ක්‍රියා පිළිවෙතක් නොමැති වීම ද පාසල්වලට ගැටලුවක් වී ඇත. එසේම ජපන් පංචවිධ ක්‍රමය හා කයිසෙන් ක්‍රමය පිළිබඳව පාසල්වල පවත්නා අවබෝධය අඩු බවක් පෙනී යයි.

මේ අනුව පාසල් පද්ධතිය තුළ සාර්ථක අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතියක් ක්‍රියාත්මක කරවීම සඳහා පියවර ගත යුතුව ඇත. ඒ අනුව සියලුම පාසල්වලට තාක්ෂණික පහසුකම් ලබා දීම සහ ඒ මගින් දත්ත පරිගණකගත කර පාසල් හා අධ්‍යාපන පද්ධතියේ ඉහළ තල අතර තොරතුරු සන්නිවේදන ජාලයක් ඇති කිරීම, තොරතුරු පද්ධති පිළිබඳව විදුහල්පතිවරුන්, නියෝජ්‍ය විදුහල්පතිවරුන් සහ තොරතුරු සම්න්ධව කටයුතු කරන නිලධාරීන් පුහුණු , ප්‍රායෝගික වීම වඩා වැදගත් වනු ඇත. එසේම පාසල් පද්ධතියේ සේවයට යොමුවන්නන් සඳහා පොදුවේ ලිපි කටයුතු පිළිබඳව මූලික පුහුණුවක් ලබා දීම ද යෝග්‍ය වේ. මේ අනුව වඩා වැදගත් වන්නේ දත්ත තොරතුරු බවට පත් කරමින් ඒවා අනාගත සැලසුම් හා තීරණ ගැනීමේ ක්‍රියාවලියට යොදා ගැනීමට හැකි ප්‍රවේශයන් හඳුනා ගැනීම ය.

පාසල් පද්ධතිය තුළ ජපන් පංචවිධ ක්‍රමය සහ කයිසෙන් ක්‍රමය ප්‍රායෝගිකව යොදා ගැනීම පිළිබඳව තවදුරටත් දැනුවත් කිරීම කළ යුතුව ඇත. පොදුවේ බලන විට සමස්ත පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක වන්නා වූ පොදු අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතියක් සඳහා යෝග්‍ය ක්‍රමවේදයන් සකස් කළ යුතුව ඇත.

මෙම පර්යේෂණය තුළින් පාසල් පද්ධතියේ නියමුවන් ලෙස කටයුතු කරන විදුහල්පතිවරුන්ටත් පද්ධතියේ දියුණුව සහ වෘත්තීය පුහුණුව අපේක්ෂා කරන පාර්ශවයන්ටත්, සිය වෘත්තීමය කර්යන් සාර්ථක කර ගැනීමේ දී අධාරකයක් වේ යැයි අපේක්ෂා කෙරේ.